**උඩුනුවර ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 11 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, වෙන්දේසි කරනු ලබන ඉඩම්වලින් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති රු.1,135,000 ක් වටිනා අක්කර 02 රූඩ් 02 පර්චස් 37 ක ඉඩම්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) එක ගමකට එක වැඩක් ව්‍යාපෘතිය යටතේ ගිවිසුම් වලට එළඹී ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් නිම කර නොතිබුණු අතර, එම ව්‍යාපෘතියට අදාළව එකතුව රු. 4,001,103 ක ණයහිමි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 1997 අගෝස්තු 08 දින සභාව විසින් ඔප්පු අංක 17310 යටතේ කඹුරාදෙණිය විහාරවත්ත නමැති ඉඩම සඳහා 29 අවුරුදු බදු ගිවිසුමකට එළඹ එහි දිග අඩි 70 සහ පළල අඩි 30 ක් වූ ප්‍රජාශාලාවක් ඉදිකොට ඇති නමුත්, එම ගොඩනැගිල්ලේ සහ ඉඩමේ වටිනාකම රු.3,720,000 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී රු.324,979 ක් වටිනා ගිවිසුම් අත්සන් නොකළ කොන්ත්‍රාත් 06 ක වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී වාහන 11 ක් වෙනුවෙන් රක්ෂණ ගාස්තු වශයෙන් දරා තිබෙන රු.202,891 ක වටිනාකමින් රු.137,334 ක් 2015 වර්ෂය වෙනුවෙන් වූ අතර එම වටිනාකම ඉදිරියට කළ ගෙවීම් ලෙස උපචිත කර නොතිබුණි.

(ඊ) ජ'නල් අංක 41 සහ 42 මගින් පිළිවෙලින් රු. 2,616,719 ක් හා රු.409,748 ක් වැඩිපුර ගිණුම්ගත කල ණයගැතියන් ලෙස එකතුව රු.3,026,467 ක් විධිමත් අනුමැතියක් ලබා නොගෙන සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

**1.3.2** නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ හිටි කඩ කුලී ආදායම කඩ කුලී ආදායම පොදු ජ'නලය අනුව රු.289,831 ක් වුවද කඩ කුලී ආදායම් ලේඛණය අනුව රු.314,415 ක් වුයෙන් රු.24,584 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) උපලේඛණ අනුව සමාලෝචිත වර්ෂයේ ණයහිමි වටිනාකම රු.62,888,939 ක් වුවද, ලෙජර් ගිණුමේ වටිනාකම රු.69,415,996 ක් වුයෙන් රු.6,527,057 ක නොසැසඳීමක් දක්නට ලැබුණි.

(ඇ) ලේඛණය අනුව පෙරසැරි ගාස්තු රු.1,484,133 ක් වුවත්, අදාළ ජ'නලය සටහන් පරිදි සමාලෝචිත වර්ෂයේ අදාල පෙරසැරි වටිනාකම රු.1,418,666 ක් වුයෙන් රු.65,467 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් වටිනාකම රු.4,901,086 ක් වුවද භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු.5,031,026 ක් වුයෙන්රු. 129,940 ක නොසැසඳීමක් දක්නට ලැබුණි.

(ඉ) ගෙවල් කුළී තැන්පත් පාලන ගිණුමේ ශේෂය රු.568,330 ක් වූ අතර, උපලේඛණ අනුව එම ශේෂය රු.67,816 ක ශේෂයක් වූයෙන්, රු.500,514 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(උ) විවිධ තැන්පත් ලේඛණය අනුව රු. 101,048 ක බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.220,147 ක හර ශේෂයක් ලෙස දැක්වීම නිසා රු.321,195 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3** ලැබිය යුතු ගිණුම්

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.67,577,894 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ 08 ක එකතුව රු.20,515,778 ක් වී තිබුණි.

**1.3.4** ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය රු.77,354,567 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ණයහිමි ශේෂයන්හි එකතුව රු.7,938,571 ක් විය.

**1.3.5** විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.10,062,472 ක් වූ ගනුදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත. | සභාවේ සේවයේ නියුක්ත කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ නිලධාරිනියකගේ 2012 වර්ෂයේ සිටද කාර්යාල කාර්ය සහායක I ශ්‍රේණියේ නිලධාරිනියකගේ 2006 ජුනි මස සිටද එකතුව රු. 105,298 ක් වූ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප අදාළ පනතේ නියමයන්ට අනුකූල නොවන ලෙස අය කිරීම නතර කර තිබුණි. මේ සඳහා විශ්‍රාම |

| | |
|---|---|
| | වැටුප් දෙපාර්තමේන්තුවේ කිසිදු අනුමැතියක් ලබා ගෙන ද නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------------------- | |
| **(i)** මු.රෙ. **371(2)(ආ)** | අවස්ථාවන් **05** කදී එකතුව රු. **220,000** ක වටිනා අත්තිකාරම්, යොමුගත රෙගුලාසියේ සඳහන් සීමාව ඉක්මවා ලබා දී තිබුණි. |
| **(ii)** මු.රෙ. **571(2)** හා **(3)** | තැන්පතු ලෙජරයේ වසර **2 - 34** ක කාලයක සිට පැවත එන තැන්පතු වර්ග **03** ක එකතු වටිනාකම රු.**461,131** ක් වී තිබුණි. |
| (ඇ) **2002** නොවැම්බර් **28** දිනැති අංක **IAI/2002/02** දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය.<br>**02,03,04,05** වගන්ති. | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද සභාව විසින් පරිහරණය කරනු ලබන මුද්‍රණ යන්ත්‍ර **14** ක් සහ මොනිටර් **17** ක් සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| **(ඈ)** **2014** නොවැම්බර් **12** දිනැති අංක **25/2014** දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය.<br>---------------------------------- | |
| **07** වගන්තිය. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව තාවකාලික පදනම මත සේවකයින් **06** දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදලින් එකතුව රු.**841,357** ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. |

**2.** මූල්‍ය සමාලෝචනය
------------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.**6,094,894** ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.**6,751,738** ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.**12,846,632** ක පිරිහීමක් දක්නට ලැබුණි.

**2.2** ආදායම් පරිපාලනය
----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රු.**21,861,617** ක් වූ හිඟ ආදායම් අයකර ගැනිම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය
------------------------------

**3.1** කළමණාකරණ අකාර්යක්ෂමතා
----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඔප්පු අංක **901** මඟින් සභාවට පැවරී ඇති පර්චස් **10** ක වෛගිරිය ඇඹිල්මීදෙණියේ හේන නමැති ඉඩම සභාව වෙත **1999** අගෝස්තු **03** දින පවරා දී තිබුණු අතර, එම ඉඩමේ කරාබු එලදාව සභාවට ගැනීමට කටයුතු නොකර බාහිර පාර්ශවයන්ට භුක්ති විදීමට ඉඩ සලසා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව රු. **516,437** ක වටිනාකමින් යුතු ලැබිය යුතු තොග හානි වර්ෂ ගණනාවක සිට පැවැත එන අතර, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීථි පහන් මීටර් **60** ක දුර පරතරයකට අනුව ස්ථානගත කළ යුතු වුවත්, ඊට පටහැනිව ස්ථානගත කර තිබූ වීථි පහන් **13** ක් ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයෙන් ගලවාගෙන ගොස් තිබුණි.

(ආ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු ආයතන පිළිබඳ හා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත් ආයතන පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි.

(ඇ) විවිධ ප්‍රතිපාදන යටතේ ඉදි කර තිබූ ප්‍රජාශාලා හා බහු කාර්යය ගොඩනැගිලිවලට අදාළ රූඩ් **01** පර්චර්ස් **16** අඩි **12/35** හා අඩි **70 x 30** ක ප්‍රමාණය ඉඩම්වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු නොකර, පිළිවෙළින් අවුරුදු **29** කට හා අවුරුදු **30** කට බද්දට ගෙන තිබුණි.

**3.3** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීයව පවතින අංක **19-5295** හා අංක **101 - 7146** දරන වාහන දෙක අපහරණය කිරීමට හෝ වෙන්දේසි කිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **2013** වර්ෂයේදී මුද්‍රණය කරන ලද රු. **440,064** ක් වූ උඩුනුවර වංශ කතාව ඇතුළත් පොත් **739** ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත්, අලෙවි නොවී පැවතුණි.

**3.4** කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය ජූනි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ නිම කළ යුතු කොන්ත්‍රාත් **04** ක් වෙනුවෙන් රු.**4,000,000** ක් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණද, ඉන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කර තිබුණේ රු. **648,480** කි. ඉතිරි මුදල වූ රු.**3,351,520** ක් අදාළ අමාත්‍යාංශය වෙත යැවිය යුතු වුවත්, එම මුදල **2014** සැප්තැම්බර් **23** දින ගෙලිඔය ලංකා බැංකුවේ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.

(ආ) **1988** ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීතී මාලාවේ **177** හා **178** රීති ප්‍රකාර ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.**5,583,467** ක් වටිනා කොන්ත්‍රාත් ප්‍රජාපාදක සංවිධානවලට පවරා ඉටු කරවා ගෙන තිබුණි.

**3.5** මානව සම්පත් කළමනාකරණය.

------------------------------------------

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂයේදී තනතුරු **04** ක අතිරික්ත නිලධාරීන් **12** ක්ද, තනතුරු **06** ක නිලධාරීන් **11** ක පුරප්පාඩු ද නිරීක්ෂණය විය.

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------

**4.1** අභ්‍යන්තර විගණනය

-----------------------------

ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණු නමුත්, එය **2009** ජුනි **09** දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක **DMA/2009(1)** දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2** ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------

සමාලෝචිත වර්ෂය සඳහා රු. **131,346,142** ක වත්කම් අත්පත් කර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3** අයවැය ලේඛනමය පාලනය

------------------------------------

(අ) වැය විෂයයන් **02** කට අදාළව විධිමත් අනුමැතියකින් තොරව, ඇස්තමේන්තුගත වියදම් ඉක්මවීම රු. **1,120,344** ක් වූ අතර, එහි පරාසය සියයට **13** සිට සියයට **21** දක්වා දක්නට තිබුණි.

(ආ) වැය විෂයයන් **06** කට අදාළව ඇස්තමේන්තුගත වියදම් කරා ළඟා නොවීම රු.**6,100,418** ක් වූ අතර, එහි පරාසය සියයට **4** සිට සියයට **58** දක්වා වී තිබුණි.

(ඇ) ආදායම් විෂයයන් **06** කට අදාළව රු.**9,614,828** ක ආදායම් අධි ඇස්තමේන්තු කර තිබු අතර, එහි පරාසය සියයට **4** සිට සියයට **48** දක්වා විහිදී තිබුණි.

(ඈ) ආදායම් ශීර්ෂ **02** කට අයත් උප විෂයයන් **03** ක් සඳහා අයවැය ගත ආදායම රු.**301,000** ක් වුවද, ආදායම් අයකර ගෙන නොතිබුණි.

(ඉ) වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්ම අනුව දීර්ඝ කාලීන පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළ යුතු වුවද, අයවැය ලේඛණය සඵල මුල්‍ය පාලන ඒකකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.** පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය